	අල්ලස්	0	0	0	0	0	0	0	0	0	0	28	0
	කුලී පුද්ගලික	2063	1664	2103	2175	2278	2187	1919	2276	2848	2886	2555	2864
	කුලී රජය	839	960	1483	1319	1339	1215	1312	1196	1441	1611	1825	1736
එකතුව		9560	9268	10167	10664	10166	11275	10512	10395	11414	11236	12798	11867
වරිපනම්	ඉඩම් ප්‍රතිශෝධන	1717	1463	1923	2535	2454	2439	2151	3410	3535	3359	5132	7435
	ගොඩනැගිලි ප්‍රතිශෝධන	346	442	418	239	234	312	323	375	383	376	415	1323
	වරිපනම් විරෝධතා පරීක්ෂණ	83	90	102	15	200	17	30	56	136	82	82	35
එකතුව		2146	1995	2443	2789	2888	2768	2504	3841	4054	3817	5629	8793

පළාත් පාලන ආයතන 170 කට ආසන්න සංඛ්‍යාවක දළ වශයෙන් දේපළ මිලියන 2.8 ක් වරිපනම් තක්සේරු සිදු කිරීමට ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

දැනුම, ආකල්ප හා කුසලතා තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වෘත්තීය විශිෂ්ඨත්වය ලභාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහෙයවීම සිදු කරයි.

පැවැත්වූ පුහුණු වැඩසටහන් - 2022.12.31 දිනට

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (පැය)	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම /ලබා ගත් දැනුම
				දේශීය (රු)	විදේශීය (රු)		
I.	ප්‍රගති සමාලෝචන කාර්යභාරය හා ඒ සම්බන්ධ මෙවලම් භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	47	1 1/2	නොමිලේ		දේශීය	ප්‍රගති සමාලෝචන කාර්යභාරය හා ඒ සම්බන්ධ මෙවලම් භාවිතය
II.	වරිපනම් ප්‍රතිශෝධන බස්නාහිර පළාත -2022	37	18	නොමිලේ		දේශීය	වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනයට අදාලව දේපල හඳුනා ගැනීම සහ අංක කිරීම ක්ෂේත්‍ර පරීක්ෂණ හා ප්‍රයෝගික ක්‍රියාකාරකම්
III.	විධායක නිලධාරි ගණයේ ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණිය තක්සේරුකරු තනතුර සඳහා සේවා පළපුරුද්ද හා කුසලතාවය අනුව බඳවා ගැනීම - සේවාරම්භක පුහුණු වැඩසටහන-2022	62	36	112,091.50		දේශීය	තක්සේරු ඒකක සහ ඒකක කළමනාකරණය දෙපාර්තමේන්තු දත්ත සටහන් ක්‍රමය / ගොනු අංකකරණය (බාහිර හා අභ්‍යන්තර ගොනු), විෂය ගොනු ලේඛන ,වලන පත්‍ර , වර්ණ තක්සේරු ඒකක පරිපාලනය තක්සේරු ඒකක මූල්‍ය කළමණාකරණය වාහන තක්සේරුකරණය කුලී තක්සේරුව ප්‍රගති පාලන පද්ධතිය හා යෝජිත ඊ තක්සේරුකරණ පද්ධතිය ආයෝජන සඳහා තක්සේරුකරණය (නාගරික සංවර්ධන අධිකාරිය / ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ වෙනත්) වාර්ෂික හා දීර්ඝ කාලීන බදු දීම සඳහා වන තක්සේරුව හා දියුණු සහ නොදියුණු වටිනාකම් දේපල අත්පත් කරගැනීම හා තක්සේරුකරණ ක්‍රියාවලිය අල්ලස් සහ වෙනත් අධිකරණ නඩු සඳහා තක්සේරු කිරීම රාජ්‍ය සහ රාජ්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම දත්ත සමුදා කළමනාකරණය (ඉඩම් විකිණීම සහ කුලියට දීම)

							අරමුදල් වෙන් කිරීම සඳහා තක්සේරු කිරීම සහ ප්‍රායෝගික සැසිය සමඟ තත්ත්ව වාර්තාව සකස් කිරීම ඉඩම් අත්පත් කරගැනීමේ සමාලෝචන මණ්ඩල නඩු කටයුතු සඳහා සුදානම් වීම වරිපනම් විරෝධතා හා වරිපනම් තක්සේරුකරණය මුද්දර ගාස්තු සහ ප්‍රාග්ධන ලාභ බද්ද සඳහා තක්සේරු කිරීම ඉඩම් අත්පත් කර ගැනීම් හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ ක්‍රියා පටිපාටිය කුලී මණ්ඩල/ අල්ලස් කොමිසම / මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය /මානව හිමිකම් කොමිසම /ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉඩම් අත්කරගැනීමේ සමාලෝචන මණ්ඩල කටයුතු පිළිබඳ ප්‍රයෝගික සැසිය
IV	ආයතන සංග්‍රහය හා මූදල් රෙගුලාසි පිළිබඳ තෙදින වැඩමුළුව	140	12/18	37,500.00		ප්‍රේෂිය	ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති මූදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I සාමාන්‍ය අර්ථ නිරූපණය ආයතන සංග්‍රහයට කරනු ලබන සංශෝදන බෙදා හරීම බලතල ක්‍රියාත්මක කිරීම II සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි සහ පත්කිරීම් සේවා ව්‍යවස්ථාවේ බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය පත්වීමේ ලිපි බඳවා ගැනීම වැඩ බැලීම් ජ්‍යෙෂ්ඨතාවය III මාරු කිරීම් IV මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථීර තත්ත්වය සහ විශ්‍රාම වැටුප් නිමිකම ප්‍රධානය කිරීම V මුදාහැරීම, කලින් දරු තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම VI සේවා ලේඛන, වාර්තා සහ සහතික VII වැටුප් VIII අතිකාල දීමනා, නිවාඩු දවස් සහ නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා XII නිවාඩු XIII දූම්රිය බලපත්‍ර XIV දිවයින ඇතුලත රාජකාරී ගමන් XVII අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර XXIV වැටුප් ණය සහ අත්තිකාරම් XXV වෘත්තීය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහය XXVI නිලධරයන්ගේ කායික යෝග්‍යතාවය පිළිබඳ වෛද්‍ය පරීක්ෂණය සහ වෛද්‍ය උපචාර XXXIII නීති උපදෙස් හා ක්‍රියාමාර්ග XLVII සාමාන්‍ය හැසිරීම හා විනය XLVIII විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති
V.	ප්‍රමාණ සමීක්ෂණය - කෙටි කාලීන පාඨමාලාව	60	90/150	200,000.00		ප්‍රේෂිය	මිනුම් ගැනීමේ මූලධර්ම SLS 573 පිළිබඳ හැඳින්වීම. මිණුම් ගැනීම හැඳින්වීම. මැනුම් මිනුම් I තනි කම්ටුවේ ගොඩනැගිල්ලක මිනුම් ගැනීම. ලුහුඬු පත්‍ර සැකසීම හා බිල් පත් සෑදීමේ සෘජු ක්‍රමය. ප්‍රමාණ බිල් පත්‍රය සැකසීම. මිනුම් II දෙමහල් ගොඩනැගිල්ලක මිනුම් ගැනීම (ව්‍යුහ අංග සඳහා) වැරගැන්නුම් කම්බි කාර්යය ලේඛණය සකස් කිරීම. ගොඩනැගිල්ලක විවිධ අංගයන් හඳුනා ගැනීම හා ශ්‍රී ලංකාවේ භාවිත කරන ගොඩනැගිලි හැඩ සඳහා වූ සම්මත මිනුම් ක්‍රමය හඳුනා ගැනීම. මිල හා ඇස්තමේන්තු සකස් කිරීම ශ්‍රම ද්‍රව්‍ය හා යන්ත්‍ර පිරිවැය හා එකක මිල සංකලනය ඒකක මිල සකස් කිරීම. ඒකක මිල ඇස්තමේන්තු, දළ, ශුද්ධ මිල කිරීම් හා දළ හා ශුද්ධ ඇස්තමේන්තු ඇගයීම්

							තනි කමිටුවේ ගොඩනැගිල්ලක් සඳහා ප්‍රමාණ බිල් පත්‍රයක් සකස් කිරීම. කමිටු ගොඩනැගිල්ලක කොන්ක්‍රීට් ව්‍යුහ රාමුව සඳහා ප්‍රමාණ බිල් පත්‍රයක් පිළියෙල කිරීම. ඇගයීම් මගින් නිපුණතාවය තක්සේරු කිරීම.
VI.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව භාෂා පාඨමාලාව	157	150 , 200	නොමිලේ		දේශීය	මධ්‍යම II කාර්යාලයේ -ශ්‍රවණාගාරය - පැය 200 පාඨමාලාව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පැය 150 පාඨමාලාව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-පැය 200 පාඨමාලාව මාර්ගගත ක්‍රමය ඔස්සේ -පැය 200 පාඨමාලාව නැගෙනහිර පළාත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පැය 150 පාඨමාලාව කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පැය 150 පාඨමාලාව
VII	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ජාත්‍යන්තර සමුළුව (ICREMV -2022)	371	12	300,000.00		දේශීය	දේපල තක්සේරුව සහ අවිනිශ්චිතතාවය දේපල සංවර්ධනය සහ කළමනාකරණය දේපල මූල්‍ය සහ ආයෝජන නාගරික හා ප්‍රාදේශීය සැලසුම්කරණය තිරසාර තත්‍ය දේපල ගොඩනඟන ලද පරිසරයේ ඩිජිටල් අනාගතය සහ ස්මාර්ට් දේපළ වෙළඳාම් දේපල, රජය සහ ප්‍රතිපත්ති දේපල වෙළඳාම් කර්මාන්තයේ වෘත්තීය ආචාර ධර්ම ආසියාවේ දේපල වෙලඳපොලේ අනාගතය සංවාදය ESG සංකල්පය (පාරිසරික , සමාජීය හා රජය) පිළිබඳ හැඳින්වීම දේපල තක්සේරු කිරීමේ අභියෝගාත්මක භාවිතයේදී ESG සංකල්පය අනුගමනය කිරීම පළාත් පාලන ආයතනවල නිශ්චල දේපල කළමනාකරණයේ පාලනයේ කාර්යභාරය අර්බුද කළමනාකරණ මෙවලමක් ලෙස සෞඛ්‍ය සම්පන්න දේපළ වෙළඳාම් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ සුපිරි වෙළඳපොලවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය කෙරෙහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑම මාළු ව්‍යළන ගෘහ කර්මාන්තයේ GIS-පාදක අවදානම් විශ්ලේෂණය; ශ්‍රී ලංකාවේ තංගල්ල ප්‍රාදේශීය සභාවේ කුඩාවැල්ල නිශ්චල දේපල තක්සේරු කිරීමේ පිරිවැය ප්‍රවේශයට BIM සහ GIS ඒකාබද්ධ කිරීම ශ්‍රී ලංකාවේ ආදායම් උත්පාදන දේපල තක්සේරු කිරීම සඳහා ක්ෂය තක්සේරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම: ඩෙල්පි අධ්‍යයනයක් නව නගර සංවර්ධනය හේතුවෙන් සමාජ හා සංස්කෘතික බලපෑම් විශ්ලේෂණය: හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සිද්ධි අධ්‍යයනය තදාසන්න ප්‍රදේශයක රථවාහන තදබදය පිළිබඳ හේතු විශ්ලේෂණය: රාගම නගර මධ්‍යයේ සිද්ධි අධ්‍යයනය තක්සේරු කිරීමේදී අවිනිශ්චිතතාවය අවම කිරීම පිළිබඳ තක්සේරුකරුවන්ගේ ආනුභවික අධ්‍යයනයක් සහයෝගීතා අවකාශයන් පිළිබඳ අවබෝධය: ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශයේ සේවකයින් ත්‍රිකුණාමලය නගර සභා බල ප්‍රදේශයේ තිරසාර නගර සැලසුම්කරණය සහ නගර සංවර්ධනය කෙරෙහි බලපාන සාධක
VIII	e - තක්සේරු ක්‍රමවේදයේ Mobile Appපරිශීලනය කිරීමේ පුහුණු වැඩසටහන	99	18	47,400.00		දේශීය	ඊ තක්සේරු ක්‍රම පිළිබඳ යෙදුම් පිළිබඳ ප්‍රයෝගික දැනුම

IX	ශ්‍රී ලංකා තක්සේරු සේවයේ I පන්තියේ III ශ්‍රේණිය තක්සේරුකරුවන් සඳහා වූ කාර්යක්ෂමතා කඩයිම් විභාගය (2022) - අභ්‍යන්තර විභාග ඉලක්කගත පුහුණු වැඩසටහන	50	6	නොමිලේ		ජ්‍යේෂ්ය	භාවිතයේ ඇති තක්සේරු ක්‍රම හා මූලධර්ම ව්‍යවස්ථාපිත තක්සේරු කිරීම් ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම් කෘෂිකාර්මික හා ඛනිජ සම්පත් තක්සේරු කිරීම වත්කම් හා කීර්තිනාමය තක්සේරු කිරීම තක්සේරු ඒකක කළමනාකරණයෙහි ලා ගැනෙන දෙපාර්තමේන්තු නියෝග හා චක්‍රලේඛ උපයෝගී කරගැනීම කළමනාකරණ සහකාර හා සහායක නිලධාරීන්ගේ රාජකාරී ඒකකයේ ප්‍රගති පාලන පළාත් තක්සේරුකරු සමඟ පැවතිය යුතු සම්බන්ධතාවය මූල්‍ය පරිපාලනයේදී කර ඇති බලය පැවරීම තක්සේරු ඒකකයේ ආයතනික කටයුතු ඒකකයේ ආරක්ෂාව හා විනය කාර්ය පටිපාටිය .
	ව්‍යවහාරික තක්සේරුකරණය						
	තක්සේරු ඒකක කළමනාකරණය						

7 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංශය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	-		

2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගලික පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදී බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේතුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මූ.රෙ. 134 (2) DMA / 1 - 2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකට ම අනුව මාසයක කාලය තළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ	.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි **134(3)** ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	විගණන හා කළමකාරණ කමිටු			
7.1	**DMA** චක්‍රලේඛ **1-2019** අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු **04** ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ		
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක **01/2017** දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ **07** වන පරිච්ඡේදය අනුව , වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ **13** වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම. සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක **05/2016** අනුව , භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත , ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම. මූ.රෙ. **772** අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස **06** කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මූ.රෙ. **103 ,104 , 109** හා **110** ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	**2016.12.29** දිනැති අංක **2016/30** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කලමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජන			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයෙන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. **94(1)** ප්‍රකාරව , සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. **571** ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. **371** ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. **371** ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් , තැන්පතු ගිණුමට බැර නොකට සෘජුව ම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. **176** අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	**20.09.2017** දිනැති **MSD** චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක **05/2008** හා **05/2018(1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ **2.3** ඡේදයේ පරිදි , පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	**2018.01.24** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **02/2018** ඇමුණුම **02** ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය **12** කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම **01** හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ **6.5** පරිච්ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම 01

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/D/GVD/02/22/18 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 22 දින

ගණන්දීමේ නිලධාරී
තක්සේරු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 251- තක්සේරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

2022 මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් හිඟ ආදායම් ප්‍රකාශයේ (ACA – 1(i)) තොරතුරු අනුව කපාහරින ලද හිඟ ආදායම රු.20,878,937 ක් ද පෙර වර්ෂ වලට අදාල හිඟ අයකර ගැනීම් රු.101,538,604ක් ද ලෙස දක්වා ඇතත් 2022 වර්ෂයේ හිඟ ආදායම් වාර්තාවට අනුව එය පිළිවෙලින් රු.4,070,381ක් හා රු.118,347,160 ක් බව නිරීක්ෂණය විය.

1.6.2 පුනරාවර්තන වියදම්

පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.514,405,063ක් වුව ද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.515,380,194ක් ලෙස වැඩියෙන් දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.975,131කින් අඩුවෙන් දක්වා තිබුණ බව නිරීක්ෂණය විය.

1.6.3 මූලධන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" ලෙස රු.7,078,033ක මුදල් ගලායාමක් දක්වා තිබුණ ද, ශේෂ පිරික්සුමට අනුව එය රු.8,053,162ක් වුයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ගලායාම් රු.975,129කින් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

ගෙවීම් වවුචර් අනුව වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් රු. 3,226,345 ක් වුව ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 82 අනුව යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් රු. 3,045,283 ක් වුයෙන් රු.181,062 ක නොසැසඳීමක් විය. සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර ඇති වායුසමීකරණ යන්ත්‍ර 02ක වටිනාකම වූ රු.181,062ක් ආරම්භක ශේෂයට ගලපා තිබීම නොසැසඳීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

1.6.5 ශුද්ධ වත්කම්/ස්කන්ධය

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.8 ඡේදයේ සඳහන් උපදෙස් අනුව, අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පත් ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් අගය ගණනය කළ යුතු වුව ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් වටිනාකම වූ රු.86,322,026කින් තැම්පත් ගිණුම් වටිනාකම වූ රු.2,155,346ක් අඩු කළ පසු ශුද්ධ වත්කම් අගය රු.84,166,680ක් වියයුතු වුවද, එය රු.83,866,680ක් ලෙස වටිනාකම රු.300,000කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.6 දේපල පිරියත හා උපකරණ සංචිතය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ පිරියත හා උපකරණ රු.430,183,481ක් ලෙස දක්වා තිබුණ ද දේපළ පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.430,483,481ක් ලෙස රු.300,000කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.7 තැන්පතු ගිණුම් ශේෂ

6000-0-0-013-0-158-0 දරන පොදු තැන්පතු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂය තුළ 2021 වර්ෂයට අදාළව රු. 822,362ක් හා 2022 වර්ෂයට අදාළව රු.541,400ක වශයෙන් එකතුව රු.1,363,762ක හඳුනා නොගත් ලැබීම් පැවති අතර ඒවා හඳුනාගෙන , ආදායමට ගැනීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 85(1) (ඇ) පරිදි හැකිතාක් තාත්වික සහ නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ආදායම රු. මිලියන 83 ක් වුව ද තත්‍ය ආදායම් රැස්කිරීම රු.මිලියන 133.1 ක් වූයෙන් තත්‍ය ආදායම් හා ආදායම් ඇස්තමේන්තු අතර සියයට 60 වැනි ප්‍රමාණාත්මක විචලනයන් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉකුත් වර්ෂයේ එය සියයට 31 ක් වී තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව දැක්වෙන හඳුනා නොගත් ලැබීම් අවස්ථා 34කට අදාල එකතුව රු.379,674ක් හා පොදු තැන්පතු ගිණුම් අනුව අනාවරණය වූ හඳුනා නොගත් ලැබීම් රු.1,363,762ක් ද වශයෙන් එකතුව වූ රු.1,743,436ක මුදලක්

විධිමත් පරිදි හඳුනා ගෙන සමාලෝචිත වර්ෂය තුළ ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. 719,500,478 ක හිඟ තක්සේරු ගාස්තු ආදායමෙන් රු.583,464,653 ක් හෙවත් සියයට 81 ක් වර්ෂ 01 සිට වර්ෂ 14 ක් දක්වා කාල පරාසයක් තුළ හිඟව පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ දී පසුගිය වර්ෂය අවසානයට පැවති රු. 705,882,194 ක හිඟ ආදායමෙන් රු. 118,347,160ක් හෙවත් සියයට 16.8 ක් පමණක් අයකර ගෙන තිබූ බව නිරීක්ෂණය වූයෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්තාව අනුව ආයතන අටකින් දිගුකාලයක් අයනොවී පවතින හිඟ ආදායම් රු.651,335,659ක් එනම් මුළු හිඟ ආදායමෙන් 90%ක් බව නිරීක්ෂණය විය.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාවේ සටහන් අංක 06ට අනුව ගාස්තු නිදහස් ආයතනවලින් අය විය යුතු ආදායම් රු.664,839ක් හිඟ ආදායම් ලෙස දක්වා තිබුණි.

(උ) ගාස්තු අයකිරීම සඳහා වූ දෙපාර්තමේන්තු වක්‍රලේඛ අංක 2020/02 අනුව වාණිජ හා වාණිජ නොවන ආයතන වශයෙන් ලැයිස්තු දෙකක් වන අතර තක්සේරු ගාස්තු කැඳවීමට හැකියාව ඇත්තේ වාණිජ ආයතන වලින් පමණි. සමාලෝචිත වර්ෂයට අදාලව ආයතන 06ක් එම ලැයිස්තු දෙකේම සඳහන් නොවූ ආයතන බව නිරීක්ෂණය වූ අතර වාණිජ හා වාණිජ නොවන ආයතන හඳුනා ගෙන ලැබියුතු තක්සේරු ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	මුදල් රෙගුලාසි 396 (ඇ)	නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.33,325ක් වටිනා චෙක්පත් 14කට අදාළව මු.රෙ. ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව අංක 6000-0-0-013-0-158-0 දරන පොදු තැන්පතු ගිණුමට බැරකර තිබූ බව නිරීක්ෂණය විය.
(ආ)	2015 දෙසැම්බර් 23 දිනැති අංක 2015/019 දරන දෙපාර්තමේන්තු වක්‍රලේඛය	මූල්‍ය තක්සේරු කාර්යයන් සඳහා අත්තිකාරම් ලබාගැනීමේ දී උපකල්පිත වෙළඳ වටිනාකමෙන් සියයට 0.5ක් හෝ රු.10,000ක් යන අගයන් දෙකෙන් අඩු අගය අත්තිකාරම ලෙස ලබාගත යුතු වන අතර කුලී තක්සේරු සඳහා අත්තිකාරම් අයකර ගැනීමේ දී උපකල්පිත කුලී වටිනාකමෙන් සියයට 0.5ක් හෝ රු.5,000ක් යන දෙකෙන් අඩු අගය අයකර ගත යුතු වේ. මෙම අත්තිකාරම් ලබා ගැනීමේ දී උපකල්පිත තක්සේරු වටිනාකම පිළිබඳව සේවා දායකයා දැනුවත් නොකිරීම හේතුවෙන් සත්‍ය තක්සේරු බිල ඉදිරිපත් කිරීමේ දී අත්තිකාරම හා සත්‍ය තක්සේරු ගාස්තුව අතර විශාල විචලතාවක් පැවතීම නිසා අදාළ සේවාදායකයන් විසින් ගෙවීම් පැහැරහරින අවස්ථා පවතින බව නිරීක්ෂණය විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) 2022 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාව අනුව 2022 වර්ෂය තුළ දී තක්සේරු දෙපාර්තමේන්තුවට නිම කිරීමට නොහැකිව ඉතිරි වූ පොදු තක්සේරු කිරීම් හා වරිපනම් තක්සේරු කිරීම් ගොනු පිළිවෙලින් 11,867ක් හා 8,793ක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දින වන විට නීති අංශයට ලද අභියාචනා 836කින් 276ක් පමණක් විභාග වී ඇති බවත් එය මුළු ලද අභියාචනා සංඛ්‍යාවෙන් සියයට 33 ක් පමණක් වන බවත් නිරීක්ෂණය වූ අතර කාර්යන් නිම නොවූ අභියාචනා 560 ක් විය.

4. මානව සම්පත් කළමනාකරණය

අනුමත තනතුරු, සත්‍ය තනතුරු හා පුරප්පාඩු හා අතිරික්ත පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක ගණය	අනුමත	සත්‍ය	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	227	92	135	-
තෘතීයික මට්ටම	565	234	331	-
ද්විතීයික මට්ටම	219	301	15	97
ප්‍රාථමික මට්ටම	101	100	04	03
එකතුව	1112	727	485	100

මෙ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 485ක් හෙවත් සියයට 43ක් පුරප්පාඩු පවතින බවත්, පුරප්පාඩුවලින් 331ක් හෙවත් සියයට 68ක් තෘතීය මට්ටමේ තක්සේරු කාර්යයන් ඉටු කරන නිලධාරීන් වන බවත් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ද්වියිතීක මට්ටමේ සංවර්ධන නිලධාරීන් අනුමත සංඛ්‍යාවට වඩා 97 දෙනෙකුගේ අතිරික්තයක් පවතින බව නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාථමික මට්ටමට ඇතුළත් කාර්යාල කාර්ය සහයක තනතුරට අනුමත සේවක සංඛ්‍යාවක් නොමැති වුව ද සේවයේ නියුක්ත නිලධාරීන් 03 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය.

බී.ඕ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට